

# අන්තරායික ධර්ම

# අන්තරායික ධම්ම


ගබ්බෙල අභයසිංහාරාමාධිපති

ආශිධර්මික ආචාර්ය

ගබ්බෙල උපනන්දාභිධාන

මාහිමියන් වහන්සේ

විසින්

ප්‍රතිගෘහිතයි

---

ගබ්බෙල ධම්මපාල

ස්වාමීන් වහන්සේ

විසින්

සම්පාදිතයි


---


ශ්‍රී: බු: වර්ෂ 2501

# අන්තරායික ධර්ම


රත්නපුරේ ගබ්බෙල අභයසිංහාරාමාධිපති

ආභිධර්මික

**ආචාර්ය ගබ්බෙල උපනන්දාභිධාන**

මාහිමියන් වහන්සේගේ ශිෂ්‍ය වූ ද, විද්‍යාලොක විද්‍යාලයෙහි
ධර්මශාස්ත්‍රාධ්‍යයනයෙහි නියුක්ත වූ ද,

**ගබ්බෙල ධම්මපාල**

ස්වාමීන් වහන්සේ

විසින්

සම්පාදිතයි.

---

අම්බලම්ගොඩ සුනන්දාරාම මහාවිහාරික
විද්‍යාලොක විද්‍යාලයෙහි උපප්‍රධානාචාර්ය ශාස්ත්‍රවිශාරද
විනයාචාර්ය

**රාජකීය පණ්ඩිත ඇන්දෙනේ දයානන්ද**

ස්ථවිරපාදයන් වහන්සේ විසින්

ශොධ්‍යපත්‍රාවලොකනයෙන්

ප්‍රශස්තයි


---


ගබ්බෙල “සමත්පාය”යෙහි

**පී. කේ. හෙන්ද්‍රික් අප්පුහාමි**

මහතා විසින්

බලපිටියේ විජේපාල මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.

# සමාවේදනය

---

අකුසලයෙන් වැලකී ලොව්ලොවුතුරු කුසල් වඩා සුවපත්වනු කැමැති සියල්ලන් විසින්ම ප්‍රමාණවත් ධර්මඥනයක් ඇතිකර ගතයුතුය යනු අමුතුවෙන් කිවයුතු නොවේ. ධර්ම ඥනයෙන් තොරවූවාහු තමන්ටත් අනුන්ටත් අවැඩ පිණිස පවත්නා නොයෙක් දේ සිදුකොට ලැබූ සම්පත්තියෙන් හා ලබන්නට තිබෙන මහත් යසඉසුරෙන් ද පිරිහෙති, දරුණු නිරාදුකට ද ගොදුරු වෙති.

මහජනයා අධර්මයෙන් වලක්වා ධර්මයෙහි යෙදවීමටත්, ඒ මගින් ඔවුන්ගේ මෙලෝ පරලෝ යහපත සලසා දීමටත්, හේතුවන කරුණු අතර, දහම් පොත්පත් සුලභ කිරීම ද එකකි. නිවන සැප ලබනු සඳහා වෙර වඩන බෞද්ධ ජනයා විසින් විශෙෂයෙන් දතයුතු, දැන දුරලිය යුතු පඤ්චානන්තරාසික ධර්මයන් විස්තර කරමින් බොහෝ පොත්පත් බලා කරුණු සංග්‍රහකොට ගෙන මේ පොත මෙසේ සකස් කැරුණේ අපේ උපසම්පත්තිය නිමිත්තකොට ගෙනය. අනවකාශතා මධ්‍යයෙහි කදිසියෙන් නමුත් මෙසේ මේ ප්‍රීතිමත් මොහොතෙහි ධර්මාව කාමීන්ටත් සංග්‍රහයක් කරන්ට ලැබීම අපට මහත් සනොතාෂයෙකි.

දුර්ලභ වූ ප්‍රව්‍රජ්‍යා සම්පත්තියෙහි අප පිහිටුවා දියුණුව සලසා වදාරන ගබ්බෙල අභයසිංහාරාමාධිපති අතිගරු ආභි ධර්මික, ආචාර්ය, ගබ්බෙල උපනන්දාභිධාන මාහිමියන් වහන්සේ වෙත මේ ග්‍රන්ථය පිළිගන්වන්නේ අතිශය කෘතඥතා පූර්වක ආචාර්යභක්ති ප්‍රේමාවනතාධ ගෞරවයෙනි.

මිල්ලවිටියේ විද්‍යාවර්ධන පරිවෙණාධිපති අතිගෞරවාර්හ සද්ධර්මවාගීශ්වර විනයකීර්ති ශ්‍රී ගොඩකුඹුරේ සිරිසුමන-තිස්සාභිධාන සපරගමු අමරපුර සිරිසද්ධම්මවංස මහානිකායේ මහානායක මාහිමියන් වහන්සේ මෙහිදී අතිශය ගෞරවාදර නමස්කාර පූර්වකව ස්මරණය කරම්හ.

එසේම, අපගේ ධර්මාචාර්යවර අම්බලම්ගොඩ සුභද්‍රාරාම මහාවිහාරස්ථ විද්‍යාලෝක මූලික උපරිම විද්‍යාලයද්වයාධීශ්වර **පණ්ඩිත ශිරෝමණීභූත ශ්‍රී සද්ධර්මභාරතීශ්වර විලේගොඩ ශ්‍රී ධර්මානන්දාභිධාන** මාහිමියන් වහන්සේ හා එම විද්‍යාලයෙහි උපප්‍රධානාචාර්ය **ශාස්ත්‍රවිශාරද, විනයාචාර්ය, රාජකීය පණ්ඩිත ඇන්දෑනේ දයානන්ද** ස්ථවිරස්වාමිපාදයන් වහන්සේ **කෙරෙහිත්** අපගේ නමස්කාර පූර්වක අප්‍රමේය ධන්‍යවාදය වේවා!

තවද, මඩලගම ශ්‍රී විජයින්ද්‍රාරාම මහාවිහාරාධිපති අපගේ ආචාර්යසම **පූජ්‍යපාද කොටාමුල්ලේ සරණජෝති** මහා ස්ථවිරස්වාමීන්ද්‍රයන් වහන්සේද, විද්‍යාලෝක විද්‍යාලයීය ආචාර්ය **මණ්ඩලායත්ත විනයාචාර්ය විලේගොඩ ධම්මරතන** ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ, **පණ්ඩිත දෙනගම අරියවංශ** ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ හා **කලාවේදී ඇම්. ඩබ්ලිව්. ලැසිරිස් ද සිල්වා** මහත්මයාද ශුභාශීර්වාද පෙරටුව මෙහිදී සිහිපත් කරමු.

මෙම ධර්මදූතයෙන් හා අදිසිල් සැපත් වීමෙන් අප විසින් අත්පත් කරගත් සියලු පින්, අපගේ දෙමවුපිය සහෝදරාදි ඥාතිවර්ගයාටත්, අභයසිංහාරාම විහාරස්ථානයෙහි හා විද්‍යාලෝක විද්‍යාලයේ සියලුම දායක දායිකා සමූහයාටත්, අප හැම දෙනටත් නිර්වාණ සම්පත් පිණිස වේවා! යි පතමු.

මේ වගට, වැඩකැමැති,

ගබ්බෙල ධම්මපාල

**2501**
**———  ජූලි 8**
**1957**

**අභයසිංහාරාමය,**
**ගබ්බෙල, පතාපිටිය,**
**කහවත්ත.**

# අන්තරායික ධර්ම

"නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස"

---

සසර සයුරෙහි වැටී අපමණ දුක් විඳින සියලු සත්ත්වයාට ලොවී ලොවුතුරු සම්පත් ලබා දෙනු කැමැති තථාගත බුද්ධ රජාණන් වහන්සේ යායුතු මග මේ යයි දක්වමින් "මේ ධර්මයෝ නෛර්යාණිකයෝය, නිවන් අරමුණු කොට සසරින් එතෙරට පමුණුවන මොවුහු සේවනය කටයුත්තෝය" යි යම්සේ වදාළ සේක් ද, එසේ ම නොයා යුතු මග දක්වමින් "මේ ධර්මයෝ අන්තරායිකයෝය, ලොවී ලොවුතුරු දියුණුව විනාශ කරන මොවුහු සත්ත්වයා නිරයට පමුණුවන්නෝය" යි ද වදාළ සේක.

"මම සම්‍යක්සම්බුද්ධ වෙමැයි ද, මම ක්ෂීණාශ්‍රව වෙමැයිද, මේ ධර්මයෝ අන්තරායිකයෝයයි ද, මේ ධර්මයෝ නෛර්යාණික යෝයයි ද වදාරන සර්වඥයන් වහන්සේට විරුද්ධව "නැත එසේ නොවේ." යයි කරුණු සහිතව චෝදනා කළ හැකි කිසිවෙක් මේ ලොකධාතුවෙහි නැත්මැයි. එහෙයින් මේ සතර තැනෙහි තමන් වහන්සේගේ විශාරද භාවය මෙහෙහි කරන සර්වඥයන් වහන්සේට උපදනා සොම්නස් සහගත සිතෙහි වූ නුවණ "චතුවෛශාරද්‍ය ඥානය" නමින් මහාසිංහනාද සූත්‍රාදියෙහි වදාරන ලද්දේය.

ශුද්ධ වූ බෞද්ධ ජීවිතයක් ගත කරනු කැමැති සියලුදෙන විසින් අන්තරායික ධර්මයෝ කවරහුදැයි විශෙෂයෙන් දතයුතුය. ආර්‍යභාවයට නො පැමිණි පෘථග්ජනයා විසින් නො කළ හැකි පාපයක් නම් නැත. බුදුරදුන් දවස බහුශ්‍රුතයෙකු හා ධර්ම කථිකයෙකු ලෙස ප්‍රසිද්ධව සිටි අරිෂ්ට ස්ථවිරයන් වහන්සේ වැන්නන් පවා වරදවා සිතීම නිසා බුදුරදුන් විසින් වදාළ අන්තරායික ධර්මයන් අන්තරායකර නො වෙතියි ප්‍රකාශ කළ

බව මජ්ඣිමනිකාය, පාචිත්තියපාළි යනාදි ග්‍රන්ථයන් ගෙන් පෙනේ. තවද අනන්තරායික ධර්මයන් වැළඳගත් දෙවදත්ත, කෝකාලික, සුනක්ඛත්ත, අජාතසත්තු ආදීන් මහත් විනාශයට පත් වූ බව ද අතිශයින් ම ප්‍රකටය.

අනන්තරායික ධර්මයන් විස්තර කරන මැදුම්සඟි අටුවාහි "**කම්ම- කිලෙස- විපාක- උපවාද ආණාවීතික්කම වසෙන පඤ්චවිධා**" යි ඔවුහු "i කර්ම ii ක්ලෙශ iii විපාක iv උපවාද v ආඥව්‍යතික්‍රම වශයෙන් පස් වැදෑරුම් වෙත්" යයි කියන ලදි. කවරාර්ථයකින් මොහු අනන්තරායික වෙත්දැයි පහදා දෙන බුද්ධඝොෂාචාර්යයන් වහන්සේ "**සග්ග මොක්ඛානං අන්තරායං කරොන්තීති- අනන්තරායිකා**" යි ස්වර්ග මෝක්ෂයන්ට අනතුරු කරන හෙයින් අනන්තරායික නම් වෙතැයි කීහ. මහාවග්ගපාළියෙහි වනාහි "කිස්ස අනන්තරායිකො? පඨමස්ස ඣානස්ස අධිගමාය අනන්තරායිකො, දුතියස්ස -පෙ- ඣානානං විමොක්ඛානං, සමාධීනං, සමාපත්තීනං, නෙක්ඛම්මානං, නිස්සරණානං, පවිවේකානං, කුසලානං ධම්මානං අධිගමාය අනන්තරායිකො" යනුවෙන් ධ්‍යානාදි සියලුම ලොවී ලොවුතුරු ධර්මයන්ට අනතුරු කරන හෙයින් "අනන්තරායික" නම් වන බව ප්‍රකාශිතය. ඒ එසේමැයි. යමෙක් මේ පස්වැදෑරුම් අනන්තරායික ධර්මයන් ගෙන් එකකට හෝ බැස ගතිත් ද; ඔවුහු දෙවදත්තාදීන් මෙන් ධ්‍යාන, ස්වර්ග, මාර්ගඵල යන සියල්ලෙන්ම පිරිහෙති. මරණින් මතු නිරයෙහි ම උපදිති.

යට දක්වූ කර්මාදි පඤ්චානන්තරායික ධර්මයන් හැර; පොහෝ පවුරුණු ආදිය සම්බන්ධ වූ "රාජචොරාදි" දස අනන්තරායක්ද, උපසම්පදාපෙක්ෂක ශ්‍රාමණේරයන් පිළිබඳවූ "කුට්ඨං ගණ්ඩො" යනාදීන් දක්වූ තෙළෙස් අනන්තරායක් ද, එබඳුම ශ්‍රාමණේරීන් පිළිබඳ "නසි අනිමිත්තා" යනාදීන් සූවිසි අනන්තරායක් ද, පැවිදි කිරීමාදියෙහි දී පරීක්ෂා කළ යුතු වූ හත්ථච්ඡින්නාදිහු දැයි නොයෙක් අන්තරායික ධර්මයෝ ඇත්තාහ. මෙසේ ඒ ඒ කරුණෙහිලා බාධක ධර්මයන් අන්තරායික නාමයෙන් ව්‍යවහාරවන අතර යට දක්වූ පරිදි ස්වර්ග

මොක්ෂයන්ට අනතුරු කරන කර්මාදීහු ම අන්තරායික ධර්ම නාමයෙන් මෙහිලා පිළිවෙලින් විස්තර වන බව මෙතෙහි කළ යුතුය.

## I කර්මාන්තරාය

දළ වශයෙන් ගෙන සැලකීමේදී ක්‍රියාව "කර්ම" යයි කියන නමුත් ධර්මානුකූලව සිදුවන ලෙස පරීක්ෂා කිරීමේදී ශාරීරික මානසික ධර්මයන් ක්‍රියා කිරීම් වශයෙන් ඇති වන චේතනාව ම "කර්ම" නාමයෙන් ගත යුතුය. කුශලාකුශල වශයෙන් දෙකොටසකට බෙදෙන කර්මයන්ගේ භේදය මෙහිලා විස්තර කිරීමට ඉඩක් නැත. අකුශල කර්මයන් අතුරෙහි බලවත් වූ i **මාතුඝාතක,** ii **පිතුඝාතක,** iii **අරහන්ත ඝාතක,** iv **සංඝභේදක,** v **ලෝහිතුප්පාදක** යන මේ බැරෑරුම් කර්මපසත් **භික්ෂුණී දූෂකකර්මයත්** කර්මාන්තරාය නම් වේ. පඤ්චානන්තරියයන්ට ඇතැම් විට ගරුකර්මයයි ද, මහාසාවද්‍යකර්මය යි ද කියති. මරණින් මතු කෙළින්ම නිරයෙහි - අවීචියෙහි උපදවන හෙයින් "ආනන්තරිය" යයි කියනු ලැබේ. කර්මාන්තරාය හය අතරෙහිවූ භික්ෂුණී දූෂණ කර්මය මොක්ෂයට මිස ස්වර්ගයට අන්තරායකර නොවේයයි අලගද්ද සූත්‍ර අටුවාහි කියන ලදී.

i මාතුඝාතක නම් තමා වැදූ මව මැරීමෙන් හෝ මැරවීමෙන් ඇතිකර ගන්නා කර්මයයි. මෙසේම ii පිතුඝාතක යනුද තමාගේ ජනක පියා මැරීමෙන් හෝ මැරවීමෙන් ඇතිකර ගන්නා කර්ම යයි. ගිහි වූ හෝ පැවිදි වූ හෝ මිනිස් ජාතියෙහි වූ රහතන් වහන්සේ කෙනෙකුන් මැරීමේදී හෝ මැරවීමේදී iii අරහන්ත ඝාතක කර්මය සිදුවේ. වෙසඟනකගේ පුත්‍රයෙක් "මේ මාගේ පියාය" යි නොදැන තමහට පියා වූ තැනැත්තා නසන්නේ නම් නැසෙන නසන දෙපක්ෂයම මනුෂ්‍යයන් වූ කල ආනන්තරිය කර්මය සම්පූර්ණ වේ. සුළු මව සුළු පියා ආදීන් ද, මනුෂ්‍ය වූවෙකු තිරිසන්ගත සිය මවුපියන් ද, තමා තිරිසනෙකුව

මනුෂ්‍ය වූ තිරිසනුන් ද, තිරිසනෙකු තිරිසන්ගත මවුපියන් ද මරන මරවන කල මාතෘඝාතක පිතෘඝාතක චේතනත් ආනන්තර්‍ය සංඛ්‍යාවට නොවැටෙන බව දක්වා ඇත. එහෙත් බැරෑරුම්වූ ඒ කර්මයෝ ආනන්තරිය ගොඩෙහිම හැපී සිටිත් මනුෂ්‍ය නොවන්නකු මනුෂ්‍ය රහත්නමක් නසන කලද, රහත් නොවූ සෙසු ආර්‍ය්‍යයන් නසල කල ද යට කී සේම දත යුතුය.

එළු බැටළු ආදි අන්‍ය සත්ත්වයෙකි කියා හෝ සොරෙකි කියා හෝ වැරදීමෙන්, මිනිස් ජාතියෙහි සිටි සිය මවුපියන් හෝ රහතුන් මරන, මරවන මනුෂ්‍ය ජාතියෙහි සිටියහුට ආනන්තරිය කර්මයම වේ. හතුරු පිරිසක් සමග සිය මව හෝ පියා හෝ රහත් නමක් සිටිනවිට "සතුරන් නසා මව හෝ පියා හෝ රහත් නම නසමි" යි සිතා හතුරන්ට පහර දෙනකල ඒ ආවුධාදිය හැපී ඒ මව හෝ පියා හෝ රහත්නම මිය යන කලද ආනන්තරිය කර්මය ම වේ. එහෙත් සතුරන්ට පහර දෙනකල මව හෝ පියා හෝ රහත්නම පලායේවායි සිතා හතුරන්ට පහරදෙද්දී මවගේ හෝ පියාගේ හෝ රහත්නමගේ ජීවිතය තොරවේ නම් එකල ආනන්තර්‍ය කර්මයක් නොවන්නේ යයි කියන ලදී. යමෙකු ලේ තැවැරුණු කඩු ආදියක් පිසදමමි යන සිතින් පිදුරු බිසී ආදියක මෙහෙයවන කල එහි සැඟවී සිටි මව හෝ පියා හෝ රහත්නමක් හෝ මරණයට පත් වේ නම් එහිලා අකුශලයක් නැත. වධක චේතනාවක් නොමැති හෙයිනි. එහෙත් ඒ ආවුධාදිය පිවිසීමේදී සත්ත්වයෙකි යන හැඟීම ඇතිවී මැරේවා යන සිතින් පිවිසවන්නාහට කර්මය වේ. පුහුදුන් ව සිටියදී දුන් විස ආදියකින් රහත් වූ පසු මිය යන කල ඒ දුන්නහුට අරහත්තඝාතක කර්මය වේ. එහිලා දෙපක්ෂයම මනුෂ්‍යයන් විය යුතුය.

තථාගතයන් වහන්සේගේ ජීවිතයට උවදුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය. එසේම අනිකකුගේ උපක්‍රමයකින් බුද්ධ ශරීරයෙන් ලේ ගැලීමක් ද සිදු නොවේ. මෙහි iv ලොහිතුප්පාදක කර්මය නම් ජීවමාන බුද්ධ ශරීරයෙන් වධක චේතනාව

ඇතිව කුඩා මැස්සකු බොන තරම් හෝ ලේ ඉපදවීමයි, කැටි ගැස්වීමයි. දෙව්දත් තෙරුන් බුදුරදුන් නසමියි සිතා පෙරලූ ගලෙහි පතුරක් සිරිපාහි හැපී ඇතුළතම ලෙයින් පිරුණේය. මෙසේ යමකින් බුදු සිරුර ඇතුළතම එක්තැනක ලේ ඉපදවීම සෙලවීම කැටිගැස්වීම ලෝහිතුප්පාද යයි කියනු ලැබේ.

v සංඝභෙදය නම් එකට විනය කර්ම කරන සමගි සංඝයා බිදු වීමයි. "**පඤ්චහි උපාලි ආකාරෙහි සංඝො භිජ්ජති**" යි වදාළ බැවින් (i) කර්ම (ii) උද්දෙස (iii) වොහාර (iv) අනුසාවණ (v) සලාකගාහ යන මේ පස් අයුරෙන් සමගි සංඝයාගේ බිදීමවේ. විනයෙහි වනාහි ඤත්තිකම්ම, ඤත්තිදුතියකම්ම ඤත්තිචතුත්ථ කම්ම, අපලොකනකම්ම යී (i) කර්මයෝ සිව් දෙනෙකි. ප්‍රාතිමොක්ෂය පිළිබඳව (ii) උද්දේශයෝ නිදානුද්දෙස, පාරාජිකුද්දෙස සංඝාදිසෙසුද්දෙස, අනියතුද්දෙස, විත්ථාරුද්-දෙස යනුවෙන් පස්දෙනෙකි.

**"ධම්ම, විනය, භාසිතා, චිණ්ණා. පඤ්ඤත්තිකා දුකා ආපත්ති, ලහු, දුට්ඨුල්ලා – සාවසෙස දුකානි ච"**

යන මේ වශයෙන් 1 අධර්මය ධර්මය කොටත්, 2 ධර්මය අධර්මය කොටත් 3 අවිනය විනය කොටත් 4 විනය අවිනය කොටත්, 5 නොවදාළ දෙය වදාළ දෙය කොටත් 6 වදාළ දෙය නොවදාළ දෙය කොටත් 7 නොපුරුදු කළ දෙය පුරුදු කළ දෙය කොටත් 8 පුරුදුකළ දෙය නොපුරුදු කළ දෙය කොටත් 9 නොපැණවූ දෙය පැණවූ දෙය කොටත් 10 පැණවූ දෙය නොපැණවූ දෙය කොටත්, 11 ඇවැත් නොවන්නක් ඇවතක් කොටත් 12 ඇවැත්වන්නක් ඇවැත් නොවන්නක් කොටත්, 13 සුළු ඇවත මහ ඇවතක් කොටත් 14 මහ ඇවත සුළු ඇවතක් කොටත් 15 අදුට්ඨුල්ල ඇවැත් දුට්ඨුල්ල ඇවැත්කොටත් 16 දුට්ඨුල්ලඇවැත් අදුට්ඨුල්ල ඇවැත්කොටත් 17 සාවසෙස ඇවැත් අනවසෙස ඇවැත් කොටත්, 18 අනවසෙස ඇවැත් සාවසෙස ඇවැත් කොටත් දැක්වීම (iii) වොහාර නම්. මොවුන්ම අටලොස් භෙදකර වස්තු යයි ද කියනු ලැබේ.

(iv) අනුසාවණය නම් ''මගේ කුලවත්කම, බහුශ්‍රැතබව ධර්මවාදීකම, කීම හරි බව, මා අපායට තමුන්නාන්සේලා මෙන්ම බිය බව නොදන්නාහුද'' යනාදි වශයෙන් වචනයෙන් කීම යි. (v) සලාක ගැන්වීම නම් යටකීසේ අනුසාවණයෙන් කැමැති කරවා තම පක්ෂයට වෙන් කරවා ගැනීම සඳහා සඟ මැදදී සලාක- තුංඩු- සීට්ටු ගැන්වීමයි. යටකී වොහාර, අනු සාවණ, සලාකගාහාපන යන තුන මූලින් සිදුවන භේදය. වොහාර, අනුසාවණ දෙකෙන් පසු සලාකගන්වා අඩුගණනේ නවනමක්වත් ඇති සඟපිරිසකින් සතරනමක් හෝ වෙන්කොට ගෙන යට දැක් වූ කර්මයක් හෝ උද්දේසයක් කිරීමෙදී සංඝ භේදය වූයේයයි කියනු ලැබේ. සංඝයා භේදකරවූ භික්ෂුවට ආනන්තර්‍ය කර්මය වේ. සංඝයා භේදකිරීමේ අදහසක් නැතිව වොහාරාදිය කරන්නහුට ආනන්තර්‍ය කර්මය නොවේ. එහෙත් සංඝභේදය වේ. බිඳුවන්නා හැරෙන විට දෙපසට අඩුගණනේ සතර සතර නම බැගින්වත් නොසිටිය හොත් සංඝභේදය නොවේ. දෙපසට බිඳුණු භික්ෂූන්ගෙන් අධර්මවාදීන්ට මහාසාවද්‍ය, අකුසල් වේ. ධර්මවාදීන්ට දෝෂයක් නැත. මෙසේ සංඝභේදයකළ හැක්කේ අඩුගණනේ නව නමක්වත් ඇති පිරිසකදීය. තවද එය ගිහියකු විසින් හෝ සාමණේරයකු විසින් හෝ නොකළහැකිය. උපසපන්භික්ෂුවක් විසින්ම කළ යුතුය. සංඝභේදය වාචසික කර්මයෙකි. මාතු ඝාතකාදි අනික් සතර කායික කර්මයෝය.

පඤ්චානන්තර්‍ය කර්මයන් අතුරෙන් සංඝභේදය ඉතා බලවත් වේ. ''කප්පට්ඨො සංඝභෙදකො'' යි වදාළ හෙයින් සංඝභේදකයා කල්පයක් නිරයෙහි අවීචියෙහි පැසේ. හෙට කල්පය ගෙවෙන්නට තිබෙද්දී අද සංඝභේදයකොට මියයේ නම් එක් දිනකින් ඒ කර්මය අවසන් වන්නේය. කල්පයාගේ විනාශයත් සමග මේ කර්මයාගේ ශක්තිය ගෙවීයේ. කර්මවිෂය අචින්ත්‍ය බව මෙහිලා මෙනෙහි කළ මැනවි. සෙසු මාතෘඝාතාදි කර්ම සතර පිළිබඳව මරණින් මතු කෙළින්ම නිරයෙහි උපදින බව මුත් කල්පයක්ම නිරාදුක් විඳින බවක් නොවදාරන ලදී. සංඝභේදය ළඟට ලොහිතුප්පාදයද, ඊළඟට අරහන්තඝාතයද

බලවත් වේ. මවුපිය දෙදෙන ශීලාදි ධර්මයන්ගෙන් සමානවන කල මාතෘඝාතක කර්මය ද, දෙදෙන ගුණයෙන් අසමාන කල ගුණයෙන් වැඩි සිටි තැනැත්තා පිළිබඳවූ කර්මය ද බලවත් වේ. යම් කර්මයක් වඩා බලවත් වේද, එය පළමුව විපාක දේ. සෙසු කර්මයෝ එයට සහාය වෙමින් සිටිති.

දේවදත්ත තෙමේ ලොහිතුප්පාදක සංඝභේදක කර්මයන් කොට ලබා තුබුණු ධ්‍යානයෙන් ද පිරිහී ස්වර්ගමෝක්ෂ මාර්ගයන් අවුරාගෙන මැරී අවීචියෙහි උපන්නේය. "සබ්බානන්තරියා නං අවීචිඵලන්තා" යි සියලු ආනන්තරිය කර්මයන්ගෙන් අවීචියෙහි ඉපදවීම කියන ලද නමුත් අසත්පුරුෂ සේවනයෙන් පිතෘඝාතකකර්මයට හසුවූ අජාතසත්තු රජ පසුව තුනුරුවන් සරණ ගොස් අචල සැදැහැති බවට පැමිණ සසුන් වැඩ වැඩූ හෙයින් අවීචියෙහි නො ඉපිද ලෝකුම්භ නම් ඔසුපත් නරකයෙහි උපන් බවත්, තිස්වා දහසක් යට ගොස් තිස්වාදහසකින් උඩට විත් මිදෙන බවත්, අනාගතයෙහි විජිතාවී නම් පසේ බුදු කෙනෙකු වන බවත් දීඝනිකායටඨ කථාවෙහි කියන ලදි. ආර්‍ය්‍ය භාවයට සුදුසුව පින් මෝරා සිටි අජාතසත්තු රජු නිහීනාශ්‍රයෙන් එය ද විනාශකොට ගෙන වැටුණු විපත ගැන මෙකල දෙවදත්ත පාක්ෂිකයන් වූ විනයවඩීන කාරයන්ට හා තාපසයන්ට අනුබල දෙන්නවුන්හට නවමත් මෙතෙහි නොවීම පුදුමයෙකි.

පඤ්චානන්තර්‍ය්‍ය කර්මයන් හා භික්ෂුණී දූෂණකර්මය කළවුන්ට මහණ උපසපන් බැව් නනතම් කර ඇත. පැවිදි බවෙහි සිටින්නකු මේ දේවල් කළහොත් ඔහු ගිහි බවට පත් කරවිය යුතුය. නැවත මහණකම නොදිය යුතුය.

## II ක්ලෙශාන්තරාය

සිත කෙළෙසන්නෝ ක්ලේශයෝය. කෙලෙසුන්ගෙන් සිත බැඳී පවත්නා තාක් සසර ගමන ද සිදුවේ. කෙලෙස් ඇත්තෝ කර්ම සිදු කරති. කර්ම නිසා විපාක ඇති වේ. මෙසේ ක්ලෙශ, කර්ම, විපාක වශයෙන් ගමන් කිරීම "සංසාර" නමි.

ජව මූල හේතුව ක්ලේශයම වේ. සිත කෙලෙසීමෙන් සත්වයන් කිලිටි වන්නාක් මෙන්ම සිත පිරිසිදු වීමෙන් ඔවුහු පිරිසිදු වෙති. සිත කෙලෙසන අර්ථයෙන් කෙලෙස් නම් වූ මොවුහු කවරහු ද? පාප සිතිවිලිය. ඔවුහු ප්‍රධාන වශයෙන් දසදෙනෙකි. 1 ලෝභ 2 ද්වේෂ 3 මෝහ 4 මාන 5 දිට්ඨි 6 විචිකිච්ඡා 7 ථීන 8 උද්ධච්ච 9 අහිරික 10 අනොත්තප්ප යනු ඒ දශයයි. මෙසේ දශක්ලේශයක් දක්වා ඇතත් නොයෙක් තැන නොයෙක් ලෙසින් මොවුන් වර්ගීව සිටින හැටි ධර්මග්‍රන්ථයන්හි දැක්ක හැකිය. ත්‍රිවිධ අකුසල මූල, චතුරොඝ, පඤ්චනීවරණ, දසසංයොජන, දසමාරසේනා, එකාදසග්ගි, යනාදි වශයෙන් ඒ ඒ ක්ලේශයෝ ඒ ඒ කටයුතු කරමින් නොයෙක් වෙස් ගෙන පෙනී සිටිති.

එක් අතකින් හිත කෙලෙසන ලෝභාදි පාප සිතිවිලි පමණක් නොව හිතත්, සියලුම කුසලාකුසලාදි සිතිවිලිත්, රූප ධර්මත් යන සියල්ලම හෙවත් රූප- වේදනා- සඤ්ඤා සංඛාර-විඤ්ඤාණ යන මූඵ පඤ්චස්කන්ධයම ක්ලේශ නාමයෙන් ගත යුතුය. සත්වයා කිළිටි කරවන- වෙහෙසට පත්කරවන- දුක් විඳුවන හෙයිනි. මෙසේ සියලුම ක්ලේශ, ගණනින් 1500ක් වන බව:

**"තිපඤ්ඤාසවිධං නාමං- රූපං නිප්ඵන්නලක්ඛණං**
**ඝනානානද්ධිති වඩ්ඪෙය්‍ය- පුන තං දසකිලෙසතො"**

යන මෙයින් කියන ලදි. සිතත් දෙපනස් සිතිවිලිත් යන නාම 53 ත්, නිෂ්පන්නරූප 18 ත්, ලක්ෂණ රූප 4 ත් යන මේ ක්ලේශ හැත්තෑපහ අභ්‍යන්තර බාහිර වශයෙන් වැඩිවී 150ක්ව එය දශක්ලේශයන් ගෙන් වැඩි වූවිට 1500 ක් වන බව ඒ ගාථාවෙන් ප්‍රකාශ වේ.

යට දැක්වූ දශ ක්ලේශයන් අතර දිට්ඨි නාමයෙන් ආ මිථ්‍යාදෘෂ්ටිය, i නියතමිථ්‍යාදෘෂ්ටිය ii අනියත මිථ්‍යාදෘෂ්ටිය යි දෙවැදෑරුම් වේ. නාමරූපාදී ධර්මයන් ගැනත් කර්ම විපාකාදිය ගැනත් ඇතිකර ගන්නා වැරදි හැඟීම මිථ්‍යාදෘෂ්ටි නම්. අසත් පුරුෂ ධර්මශ්‍රවණය, අසත්පුරුෂාශ්‍රය, ආයයීයන් දක්නම

නොලැබීම, වරදවා සිතීම යන කරුණු සතර මිථ්‍යාදෘෂ්ටිය ඇතිවීමට හේතු වන්නේය. නාමරූපාදිය නිත්‍යශුභආත්මාදි වශයෙන් ගැනීම ඇතත්, කර්මවිපාකාදිය පිළිගන්නහුගේ දෘෂ්ටිය අනියත මිථ්‍යාදෘෂ්ටි නමැයිද කර්මවිපාකාදිය නොපිළිගන්නහුගේ දෘෂ්ටිය නියතමිථ්‍යාදෘෂ්ටි නමැයිද කියනු ලැබේ. මේ දෙක අතුරෙන් නියත මිථ්‍යාදෘෂ්ටියම මහාසාවද්‍ය වේ.

''මිච්ඡාදිට්ඨි නියතා වුත්තා අකිරියා නත්ථි හේතුකා' යි දක්වෙන හෙයින් i අක්‍රියදෘෂ්ටිය ii නාස්තික දෘෂ්ටිය iii අහේතුක දෘෂ්ටිය යයි අනියත මිථ්‍යාදෘෂ්ටිය තුන් වැදෑරුම්වේ පින්පව් කියා දෙයක් නැත. දනමානාදියෙන් හෝ ප්‍රාණඝාත අදත්තාදානාදියෙන් හෝ සිදුවන පිනක් හෝ පවක් නැත. කෝක කළත් එකය' යනාදි වශයෙන් ගැනීම අක්‍රියදෘෂ්ටි නම්. දනමානාදි වූ කිසිම දෙයක විපාකය කියා දෙයක් නැත, යනාදීන් කර්මයාගේ විපාකය නොපිළිගැනීම නාස්තික දෘෂ්ටිය නමින් උගැන් වේ. සත්ත්වයාගේ උත්පත්තියට හෝ සංසාර ශුද්ධියට කිසිම හේතුවක් නැත, සියල්ල ස්වභාවධර්ම වශයෙන්ම සිදුවේයයි සැලකීම අහේතුකදෘෂ්ටි නමැයි කියන ලදි.

මේ කියූ අක්‍රියාදි ත්‍රිවිධ දෘෂ්ටීහු දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙහි ඇතුළු වෙති. 1 දුන් දෙයෙහි පල විපාක නැත; 2 යාග යෙහි හෙවත් මහාදනයෙහි පලවිපාක නැත; 3 පිටත්කර හරින සත්කාරයෙහි පලවිපාක නැත; 4 පින් පව්වල විපාක නැත; 5 පරලොව සිටියහුට මෙලොව කියා දෙයක් නැත; 6 මෙලොව සිටින්නහුට පරලොව කියා දෙයක් නැත; 7 මවු කෙරේ හොඳ නොහොඳ පැවැත්මෙන් පලක් නැත; 8 පියා කෙරේ හොඳ නොහොඳ පැවැත්මෙන් පලක් නැත 9 මැරී උපදනා සත්ත්වයෝ නැත; 10 මෙලෝ පරලෝ නුවණින් දැන කියන බුදු පසේබුදු-මහරහත්හු නැත යන මේ වැරදි කල්පනා දනය දසවත්ථුක මිච්ඡාදිට්ඨි නාමයෙන් උගන්වනු ලැබේ.

යට දක් වූ ත්‍රිවිධ වූ හෝ දසවැදෑරුම් වූ නියත මිථ්‍යා දෘෂ්ටිය යමෙක් වැළඳ ගනිත්නම් ඔවුහු ධ්‍යානමාර්ගඵලාදියෙන් හා මරණින් මතු ස්වර්ගසම්පත්තියෙන් ද පිරිහෙති. මේ නියත මිථ්‍යාදෘෂ්ටියම ක්ලේශාන්තරාය නම් වේ.

මෙහි දැක් වූ මිථ්‍යාදෘෂ්ටීන් හැර දසවිචජිතන, දසවත්ථුක අන්තග්ගාහික දිට්ඨි, සොළස දිට්ඨි, විංසතිවිධ සක්කාය දිට්ඨි යනාදි නානා දෘෂ්ටිහු ධර්මයෙහි දක්නා ලැබෙති. එහෙයින් ඒ සියල්ල බ්‍රහ්මජාල සූත්‍රයෙහි එන දෙසැට මිසදිටුවලට ඇතුළත් වෙතියි කියන ලදි. රාශි දශයක ඇතුළත්වන දෙසැට මිසදිටු මෙසේයි:

| | | |
|---|---|---|
| 1. | සස්සතවාද | 4 |
| 2. | එකච්ච සස්සතවාද | 4 |
| 3. | අන්තානන්තික | 4 |
| 4. | අමරා වික්ඛෙප | 4 |
| 5. | අධිච්ච සමුප්පන්න | 2 |
| 6. | සඤ්ඤීවාද | 16 |
| 7. | අසඤ්ඤීවාද | 8 |
| 8. | නෙවසඤ්ඤී නාසඤ්ඤීවාද | 8 |
| 9. | උච්ඡෙදවාද | 7 |
| 10. | දිට්ඨධම්ම නිබ්බාණවාද | 5 |
| | **එකතුව** | **62** |

ශාශ්වත, උච්ඡෙද යයි දෘෂ්ටීන්ගේ භෙද දෙකකි. දෙසැටදිටු අතර උච්ඡෙදවාද හත පමණක් උච්ඡෙදදිට්ඨි ගණයෙහි වැටේ. සෙසු පස්පනස් දිටුම ශාශ්වත ගණයෙහි ඇතුළුවේ. සත්ත්වයා මරණයෙන් මතු නෝ යම් භවයකට පැමිණ එහිදී විනාශ වේ යයි සලකන්නෝත්, අතීතයේ උපන්නේත් නැත, මතු උපදින්නේත් නැතැයි සලකන්නෝත් උච්ඡෙද දිට්ඨිකයෝය. දිගින් දිගට යන නිත්‍ය වූ ආත්මයක් ඇතැයි ගන්නෝ, සත්ත්වයෝ කර්මානුරූපව යම් භවයකට පැමිණ එහි හැම ද දුක් හෝ සැප විඳිමින් සදාකාලයෙහි සිටින්නාහුය''යි සලකන්නෝ ශාශ්වත දෘෂ්ටිකයෝය. දෙසැටදිටු ගැන නිරවුල් දැනුමක් ලබාගනු කැමැත්තෝ "සිංහල දික්සඟියේ" 328- 338 පිටු බලත්වා!

රූප, වේදනා, සඤ්ඤා සංඛාර, විඤ්ඤාණ යන පඤ්ච ස්කන්ධයෙන් එක් එක් ස්කන්ධය ආත්මය වශයෙන් ගැනීම (=5), ආත්මය නම් එක් එක් ස්කන්ධයකැයි ගැනීම (=5), එක් එක්

ස්කන්ධයක ආත්මය පිහිටියේයයි ගැනීම (=5), ආත්මයෙහි එක් එක් ස්කන්ධය පිහිටියේයයිගැනීම (=5), යනුවෙන් දැක්වෙන විසි වැදෑරුම් (5 × 4 = 20) සක්කාය දිට්ඨිය අනියත දිට්ඨි සංඛ්‍යාවෙහි ගැනේ. එය ස්වර්ගමෝක්ෂයන්ට අන්තරායකර නොවේ. ඇතැම් දෘෂ්ටීන්ගෙන් ස්වර්ගයද, සමහර දෘෂ්ටීන්ගෙන් මාර්ග ඵලද, අක්‍රියාදි නියත මිථ්‍යාදෘෂ්ටීන්ගෙන් ස්වර්ගමෝක්ෂ දෙකමද විනාශ කැරෙන බව කියන ලදි.

බුද්ධාදි සත්පුරුෂයන්ගේ අවවාද ලබා මිථ්‍යාදෘෂ්ටිය හැර දැමූ කල ස්වර්ගමෝක්ෂ සම්පත් ලැබිය හැක. යමෙකු නියත මිථ්‍යාදෘෂ්ටියෙන් යුතුව මරණයට පත් වුවොත් ඔහුට නිරය සිය ගෙයක් මෙන් වේ. ඔහු සසරට කණුවකි, පොළොව රකින්නෙකි, ඔහුට භවයෙන් නැගීමක් නැත. පුරුද්ද හේතු කොටගෙන හේ මතු භවයන්හිදීත් මිසදිටුවම රුචි කෙරේ.

නියත මිථ්‍යාදෘෂ්ටිය වනාහි පඤ්චානන්තරීය කර්මයටද වඩා අතිශයින් බරපතලය. එහෙයින් වදාළහ "මිච්ඡාදිට්ඨිපරමානි භික්ඛවෙ වජ්ජානි" යි. ආනන්තරීය කර්මයන් අතර ඉතාමත් බරපතල වූයේ සංඝභේදයයි. "කප්පට්ඨො සංඝභෙදකො" යි වදාළ හෙයින් සංඝභේදකයා පවා කල්පයක් නිරයේ පැසී මිදෙයි. කල්ප විනාශයෙහි අවශේෂ සත්ත්වයන් බඹලොව උපදින කල ද මිච්ඡාදිට්ඨිකයා එහි නොඉපිද අන් සක්වලක නිරයෙක පැසෙයි. සියලුම චක්‍රවාටයන් විනාශ වන කලෙක තම් අහසෙහි එක් පෙදෙසක නිරයෙහිමෙන් අපමණ දුක් විඳිමින් පැසේ. මෙසේ නියත මිච්ඡාදිට්ඨිකයාට දරුණු විපාකයාගේ අවසානයක් නැත.

දරුණු විෂඝෝර සර්පයන් වැනි වූ මිසදිටුවන් අතර බුද්ධකාලයෙහි සිටි ෂට්ශාස්තෘවරයන් හා දෙව්දත්ත පාක්ෂිකයන් ද ගෙන ගිය ව්‍යාපාරයේ ඌනපූරණය මෙරට "විතය මඬිත" "තාප-සද" යන් විසින් කරගෙන යන බව පෙනේ. බෞද්ධයෝ පරෙස්සම් වෙත්වා!

## III විපාකාන්තරාය

කර්මයක් ඇති කල්හි විපාකයක් ද ඇත්තේය. කර්මය එකකි, විපාකය අනිකකැයි නොසිතියයුතු. කර්මයාගේම පරිණාමය- මේරීම විපාක නමින් ගන්නා හෙයිනි. විපාක නම් පැසීමයි. කවරකුගේ පැසීමද? කර්මයාගේම පැසීමයි. විපාකය වනාහි ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාකය යි ද්විවිධය. කුශලාකුශලයන් ගේ පූර්වචේතනා, අපරචේතනා කර්මනාමයෙන්ද, මධ්‍යචේතනා කර්මපථ නාමයෙන්ද සැලකෙති. කර්මපථයන්හි අර්ථය නම් “සුගතියකට හෝ දුගතියකට යැමට හේතුවන කර්ම” යනු යි. කර්මපථයෙන් ප්‍රතිසන්ධි විපාක ලැබේ. කර්මයෙන් ප්‍රවෘත්ති විපාක ලැබේ. සියලුම උත්පත්තීහු ප්‍රතිසන්ධි විපාකයෝය. උපන් පසු ලැබෙන සම්පත්ති විපත්තීහු ප්‍රවෘත්ති විපාකයෝය. එහි ලා ආචාර්ය මත භේදත් ඇත.

“පණ්ඩක - තිරශ්චීනගතික - උභතොබ්‍යඤ්ජනක යන්ගේ ප්‍රතිසන්ධිධර්මයෝ විපාකාන්තරායික නම් වෙති” යි මැඳුම් සඟි අටුවාව කියයි. පණ්ඩක, උභතොබ්‍යඤ්ජනකයෝ කුසලවිපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තයෙන් ද. තිරශ්චීනයෝ අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තයෙන්ද ප්‍රතිසන්ධිය ලබති. කුශලක්‍රියාවන්හිදී අලොභ අදෙස හේතු දෙක නොලබන හෙයින් ද්විහෙතුක වූ ඔමක කුශලයන්ගෙන් පණ්ඩක උභතොබ්‍යඤ්ජනකාදීන් ගේ ප්‍රතිසන්ධිය ගෙන දේ. ඔවුන්ගේ ප්‍රතිසන්ධිය අහෙතුකම වේ, ඔවුහු සුගතිඅහෙතුක නමින් හැඳින් වෙත්. තිරශ්චීනයෝ දුගතිඅහෙතුකයෝය. ප්‍රතිසන්ධිවිඥානයත් සමග පහළ වන අලොභ, අදොස, අමොහ යන කුසල හේතු තුන නොලබන හෙයින් අහෙතුක නම් වෙත්. “ද්විහේතුකානම්හේතුකානඤ්ච පනෙත්ථ ක්‍රියාජවනානි චෙව අප්පනාජවනානි ච න ලබ්භන්ති” යනු අර්ථකථාපාඨ හෙයින් ද්විහේතුක අහෙතුක කර්මයන්ගෙන් ප්‍රතිසන්ධි ලැබූවනට ධ්‍යාන-මාර්ගඵල නොලැබෙන බව කියන ලදී. “විපාකාවරණ සම්භාවතො ද්විහෙතුකපටිසන්ධි පි විපාකාවරණන්ති වුච්චති” යන විභාවිනීටීකා වචනයෙන්ද ද්විහෙතුක අහෙතුක ප්‍රතිසන්ධිය විපාකාවරණ නම් වන බව පෙනේ.

මූලප්‍රතිසන්ධිය විකල වූ හෙයිනි. පණ්ඩක, තිරච්ඡාන, උභතොබ්‍යඤ්ජනකයන්ට පමණක් නොව, පෙත අසුරනෙරයි-කයන්ටද ජච්චබධිර, ජච්චන්ධ, ජච්චමූග, ජච්චජළ, ජච්චුම්මත්තක, මම්මක යන මොවුන්ටද ධ්‍යාන මාර්ග ඵලයන් ලැබිය හැකි නොවේ. එහෙත් ඉතා කලාතුරකින් විනිපාතිකාසුරයන් අතර ද්විහෙතුක ත්‍රිහෙතුකයෝ ද වෙති. ත්‍රිහෙතුකයෝ මාර්ග ඵලාව බොධයද කරති උත්තරමාතා, ප්‍රියංකරමාතා යනාදීන් ගැන සලකන්න. පණ්ඩකාදීන්ගේ ප්‍රතිසන්ධි ස්වර්ගයට තදින් බාධා කරන බවක් නො පෙනේ.

**''ෂණ්ඩකා'පක්කමිකා'සිත්තා චතුත්ථෝ පක්ඛ'සූයකො;**
**නපුංසකෙන පඤ්චෙ'තෙ පණ්ඩකා පරිදීපිතා'' යි**

විනයවිනිච්ඡයෙහි i පක්ඛපණ්ඩක ii ඕපක්කමික පණ්ඩක iii ආසිත්ත පණ්ඩක iv උසූයපණ්ඩක v නපුංසක පණ්ඩකයයි පණ්ඩකයන්ගේ පඤ්චවිධ වූ භේදය කීහ. සාමාන්‍යයෙන් පණ්ඩක යනු ලිඞ්ග විකල වූවන්ට කියන නමකි. උසූය, ආසිත්ත පණ්ඩකයන් දෙදෙනාට පැවිද්ද තහනම් නැතැයි ද, අනික් තුන් දෙනාට තහනම් යයි ද කියන සමන්තපාසාදිකා අටුවාව; කුරුන්දි නම් අටුවාවේ හැටියට පක්ඛපණ්ඩකයාට පණ්ඩක නොවන පක්ෂයෙහි පැවිද්ද තහනම් නැතැයි ද කියයි. පණ්ඩකයන් ගැන විස්තර ''සිංහලසාරසංග්‍රහ''යෙන් බලා ගත හැක.

මනුෂ්‍යාදීන් මෙන් නොව හරහට ගමන් කරන්නෝ තිරච්ඡානයෝය. ඔවුහු අපාද, දිපාද,, චතුප්පාද, බහුප්පාද, වශයෙන් සිව් වැදෑරුම් වෙති. නැවත ජලජ, ථලජ යනුවෙන් ද ද්විවිධ වෙති. ජලජතිරච්ඡානයන් ගේ ගණන අන්‍ය සියලු සත්ත්වයන්ගේ ගණනටත් ඉතා වැඩි බව බුදුරජාණන් වහන්සේම වදාළහ.

රාගවශයෙන් ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම ඇත්තෝ උභ-තොබ්‍යඤ්ජනකයෝය. ඔවුන්ට, රාග වශයෙන් ස්ත්‍රීන් වෙත යනවිට පුරුෂ නිමිත්තද, පුරුෂයන් වෙත යනවිට ස්ත්‍රී නිමිත්තද පහළවෙතියි කියනු ලැබේ. ස්ත්‍රීඋභතොබ්‍යඤ්ජනක, පුරුෂ උභතොබ්‍යඤ්ජනක යයි ඔවුන්ගේ කොටස් දෙකකි.

ස්ත්‍රී උභතොව්‍යඤ්ජනකයා තමනුත් ගැබ් ගනී, අනුනුත් ගැබ් ගන්වයි. ඔහුට ස්ත්‍රී නිමිත්ත ප්‍රකට වේ. පුරුෂ නිමිත්ත අප්‍රකට වේ. පුරුෂ උභතොව්‍යඤ්ජනකයා අනුන් පමණක් ගැබ් ගන්වයි. මොහුට පුරුෂනිමිත්ත ප්‍රකට වේ. පණ්ඩක යන්ට මෙන්ම තිරච්ඡානගත, උභතොව්‍යඤ්ජනකාදීන්ට ද පැවිදි උපසපන් බැව් තහනම් කොට ඇත.

## IV උපවාදන්තරාය

ආර්‍යෝපවාදයෝ උපවාදන්තරායික නම් වෙතැයි පපඤ්චසූදනී අටුවාහි කියන ලදී. ආර්‍යයෝ නම් සෝවාන් ආදි මාර්ග ඵලයනට පැමිණි උතුමෝය; බුදු-පසේබුදු-මහරහතන් හා අනගැමි; සෙදගැමි; සෝවාන් පුද්ගලයෝය. යටත්පිරිසෙයින් ගිහි සෝවාන් පුද්ගලයෙකුට හෝ අවැඩ කරන සිතින් නින්දා අපහාස- චෝදනාදිය කරන්නහුට ආර්‍යෝපවාද කර්මය වේ. එය ආනන්තර්‍ය කර්මය මෙන් බැරෑරුම් වූවකි. එය ස්වර්ගමෝක්ෂ දෙකටම අන්තරාය කෙරේ. එහෙත් ආර්‍යෝපවාදය පිළියම්කළ හැකිකර්මයකි. ආර්‍යයන්ටත්; සෙසු පැවිද්දන්ටත්, මවුපියන්ටත් චෛත්‍ය — බෝධිවෘක්ෂයන්ටත් කරන ලද අපරාධ; සමාව ගැනීමෙන් පසු අවිපාක භාවයට- අහෝසිකර්ම බවට යන බවත්; ප්‍රයෝගසම්පත්තියෙන් වළක්වන ලද ඒ කර්මයන්ගෙන් ස්වර්ගමෝක්ෂාන්තරාය නොවන බවත් මනෝරථපූරණී නම් අංගුත්තරට්ඨකථාහි සඳහන් වේ. මේ ඊට සාධකයෙකි:

"දරුවන් දෙදෙනෙකුගේ පියෙක් වූ සෝරෙය්‍ය සිටුහුමා දිය නාන්ට යන අතරමඟ, සිවුරු පොරවමින් සිටි කච්චායන මහරහතන් වහන්සේ දැක !"මෙතෙම මට භාර්‍යාව වේ නම් ඉතා මැනවි; නැත්නම් මගේ භාර්‍යාවගේ පාට මෙබඳු වන්නේ නම් ඒත් මැනවි" කියා සිතීය. එකෙණෙහිම ඔහුට ස්ත්‍රීලිඞ්ගය පහළ විය. ලජ්ජාවට පැමිණ පලාගිය ඇ තක්සලා නුවර සිටුපුත්‍රයකු කෙරේ වැස දරුවන් දෙදෙනෙකුද වැදුවාය. පසුව යහළු වූ සිටු පුත්‍රයකුගේ මාර්ගයෙන් කච්චායන මහ තෙරුන් වහන්සේ සමාකරවාගත් කෙණෙහි පුරුෂ ලිඞ්ගය පහළ වූයෙන් දෙදරුවන් පියාට භාරදී තෙරුන් වහන්සේ කෙරේ පැවිදිව රහත් බවට පැමිණියේය." වැඩි විස්තර සද්ධර්මරත්නාවලියෙන් බලාගත මැනවි.

දිනක් ගිජ්ඣකූට පව්වෙන් බස්නා මහාකච්චායන තෙරුන් වහන්සේ දුටු වස්සකාර බමුණා "මූන්වහන්සේ හරියට වඳුරෙකු මෙනැ"යි කීය. බුදුරදුන් ඒ අසා "බමුණ, තෙරුන් සමාකරවා ගනුව, ඉදින් එසේ නොවේනම් මේ වේළුවනයෙහිම ගොනෙකු මෙන් මහ නගුටක් ඇති වඳුරෙක් වන්නෙහි" යයි වදාළ නමුත් සමාව නොගෙන බුදුවදන් නිබොරුවන බව සලකා වඳුරුව උපන් පසු හැසිරීමාදියට එහි අඹ ආදි ගස් රෝපනය කරවා ආරක්ෂාව සැලැස්වීය. වදාළ පරිදිම හෙතෙම මරණින් පසු වඳුරුව උපන්නේ "වස්සකාරය" යයි ඇමතූවිට ළඟට එයි. සමා කරවා නොගත් ආර්‍යෝපවාදය මෙසේ ස්වර්ග මෝක්ෂ දෙකට අන්තරායකර වෙයි. අපායොත්පත්තියට කාරණවෙයි. ප්‍රදුෂ්‍ය වූ නපුරු හිතින් කරන ආර්‍යෝපවාදය කොකාලිකාදීන්ට මෙන් මෙලොවදීම කුරිරු විපාක පිණිස ද පවත්නේය. පුහුදුන් ගුණවත් සිල්වත් උතුමන්ට ගරහා කිරීමද බරපතල පාපයෙකි.

යම් ආර්‍යයන් වහන්සේ නමකට උපවාද කරන ලද්දේ නම් උන්වහන්සේ ඉදිරියෙහිදී හෝ, අන්‍යදිශාවකට උන්වහන්සේ වැඩම කළාහු නම් තමා ම එහි ගොස් හෝ; ශිෂ්‍යයෙකු යවා හෝ; එහි යන්නටත් යවන්නටත් නොහැකි කල ඒ විහාරයෙහි අන්‍යභික්ෂූන්ගෙන් හෝ; ක්ෂමාව ලබා ගත යුතුයි. නොහඳුනන ආර්‍යයන් වහන්සේ නමකට උපවාද කළ පසු උන්වහන්සේ කොහි වැඩමකළ සේක් දැයි නොදන්නාවිට අන්‍ය නුවණැති භික්ෂූන් වහන්සේ නමක් ඉදිරියෙහි කාරණ කියා ආර්‍යයන් වහන්සේ වැඩමකළ දෙසට ඇඳිලි බැඳ "සමාවෙත්වා" යි කිය යුතුය. පිරිනිවි කාලක නම් ඒ ආර්‍යයන් වහන්සේ ගේ ඇඳ වෙත හෝ සොහොන වෙත හෝ ගොස් සමාකරවාගත යුතුය.

## V ප්‍රඥප්තිව්‍යතික්‍රමාන්තරාය

"සංඝසුට්ඨුතාය" යනාදි දසානිසංසයක් සලකා තථාගතයන් වහන්සේ විසින් වදාළ විනය ශික්ෂාප්‍රඥප්තිහු, ආඥා දෙසනා නමින් හැඳින්වෙන විනයපිටකයෙහි එති. ගිහින් උදෙසා පැණ වූ විනය නීතිරීති සූත්‍රපිටකයෙහිම එයි අඹ කථාහි පැවිදි විනය ගෙන "දැන දැන ඉක්මවන ලද සප්තාපත්තිස්කන්ධයෝ ආඥාව්‍යතික්‍රමාන්තරායික (ආඥා - පඤ්ඤත්ති

වීතික්කමාන්තරායිකා) නම් වෙති' යි කීහ, ඒ එසේමැයි. දැන දැන ඉක්මවන ලද දුක්කට, දුබ්භාසිතයෝ පවා ස්වර්ගමෝක්‍ෂ දෙකට අනතුරු කරති, විපිළිසරට කාරණ වන හෙයිනි


**"නවකෝටිසහස්සානි — අසීතිං සතකෝටියෝ,**
**පඤ්ඤාසං සතසහස්සානි— ඡත්තිංසා ච පුනාපරෙ"**

යන සංග්‍රහ ගාථාවෙන් විනය ශික්‍ෂා 9189503б000 ක් බව කියන ලදි. ඒ වනාහි ආභිසමාචාරික, ආදි බ්‍රහ්මචරියක සියලු නීතිරීතින් එක්කොට ගැනීමෙනි භික්‍ෂු ප්‍රාතිමොක්‍ෂයෙහි වනාහි: පාරාජිකා (4), සංඝාදිසෙස (13), අනියත (2), නිස්සග්ගිය පාචිත්තිය (30), පාචිත්තිය (92), පාටිදෙසනීය (4), සෙඛියා (75), අධිකරණ සමථ (7) යනුවෙන් ශික්‍ෂාපද 227 ක් ඇත. එහෙත් **"සාධිකං දියඩ්ඪං සික්ඛාපදසතං"** යනුවෙන් භාග්‍යවතුන්වහන්සේ විසින් (උපසපන්) භික්‍ෂූන්ට පැණවූ ශික්‍ෂාපද 150 ට කිපයක් වැඩිය යි "මිළින්දපඤ්හ" යෙහි සඳහන් වේ. සෙඛියා 75 අඩු කළ විට ශික්‍ෂා 152 ක් ලැබේ.

විනයෙහි වනාහි 1 පාරාජිකා, 2 සංඝාදිසෙස, 3 ථුල්ලච්චිය පාචිත්තිය, 4 පාටිදෙසනීය, 5 දුක්කට, 6 දුබ්භාසිත යනුවෙන් ආපත්තිස්කන්ධයෝ (වැරදිගොඩවල්) හතකි මොවුන්ට අයත් ශික්‍ෂාවන් දැන දැන බිඳීම ස්වර්ගමෝක්‍ෂ දෙකට අන්තරායකර වුවත් ආයෙතිංපවාදය මෙන් ශුද්ධියෙහි පිහිටන්නහුට අන්තරායකර නොවේ. එහි පාරාජිකා ඇවතට පැමිණියවුන් හට ගිහිවීමෙන් හෝ සාමණේර බවට පැමිණීමෙන් ශුද්ධිය ලබා ගත හැක. සංඝාදිසෙසයන්ට පැමිණි කල වත්මානත්පුරා අබ්භාන කරවා ගැනීමෙන් ශුද්ධිය ලැබේ. සෙසු ථුල්ලච්චයාදි සියලු ඇවැත්වලින් පිරිසිදුවීම සඳහා කළ යුත්තේ අන්‍ය භික්‍ෂුවක් ඉදිරියේ ප්‍රකාශ කිරීම ඇවැත් දෙසීම පමණකි. ඇවැත්දෙසීම යනු කළවරද කියා ආයති සංවරයෙහි පිහිටීමයි. ගිහියන් විසින් ගිහිවිනය කඩකිරීමාදියට පැමිණි කලද "මතු මෙසේ නොකරන්නෙමි" යි ඉටාගත් කල ශුද්ධිය ලැබේ.

චතුවෛශාරද්‍යඥානය හා සම්බන්ධ වූ "අන්තරායිකා ධම්මා" යන වචනයෙන් පඤ්ඤත්ති වීතික්කමනය ගැනෙන බව අටුවාවෙහි කීහ. එය නොසුදුසුය. චතුවෛශාරද්‍යඥානය සියලු බුදුවරයන් වහන්සේලාටම ඇත. අටුවාමතය පිළිගනී නොහොත් දීඝායුෂ්ක බුදුවරයන්ට වෛශාරද්‍යඥාන තුනකට වඩා දැක්විය නොහැකිය. උන්වහන්සේලා විනය නීතිරීති නොපණවන හෙයිනි. (ඉඩ මඳකම නිසා සංක්‍ෂිප්ත කැරිණි.)

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු